# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 148/8 — 1975 ජනවාරි 30 වැනි බ්‍රහස්පතින්ද — 1975.01.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.—බී. 51/50. කොළඹ වරාය (පාලන) පනත

(238 වන අධිකාරය වූ) කොළඹ වරාය (පාලන) පනතේ 12 (2) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

පී. බී. ජී. කලුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා.

1975 ජනවාරි මස 28 දින,
කොළඹ දීය.

### නියෝග

1. මෙ නියෝග 1975 කොළඹ වරාය (වරාය ගාස්තු) නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

### (1) අලියා බෝට්ටු ගාස්තු

නැංගුරම් බෝට්ටු පාවිච්චි කිරීම සඳහා අය කෙරෙන ගාස්තු

2. ආණ්ඩුවේ අලියා බෝට්ටු පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ගාස්තු අය කරනු ලැබිය යුතුය :—

| | රු. | ශ. |
|---|---|---|
| (i) වරායට ඇතුල්වීමේ දී නැංගුරම් දැමීමට සහ වරායෙන් පිටත්ව යාමේ දී නැංගුරම් ඉවත් කිරීම සඳහා හා වරාය තුළ නැංගුරම් පළවල් මාරු කරන යාත්‍රාවලට සහාය දීම සඳහා එක් අලියා බෝට්ටුවකට ... ... | 600 | 0 |
| (ii) ආඥාවක් යටතේ නොවූ අවස්ථාවන්හි දී වරාය තුළ නැංගුරම් පළවල් වෙනස් කරන යාත්‍රාවලට සහාය වීම සඳහා එක් අලියා බෝට්ටුවකට ... ... ... | 1,200 | 0 |
| (iii) වරායෙන් පිටත එහෙත් වරායට අයිති සීමාවන් තුළ යාත්‍රාවලට සහාය වීම සඳහා පැයකට ... ... | 1,800 | 0 |
| (iv) වරායෙන් පිටත හා වරාය සීමාවන්ගෙන් පිටත වැඩ සඳහා (අලියා බෝට්ටු කුලියට දීම සඳහා වරාය කොමසාරිස් විසින් ගාස්තු නියම කරනු ලැබිය යුතුය) ... ... ... | — | |
| (v) ගිනි නිවන ජලනළ පාවිච්චි කිරීම සඳහා පැයකට ... ... ... ... | 600 | 0 |
| (vi) අලියා බෝට්ටුවකින් යාත්‍රාවකට වාෂ්ප බලය සැපයීම සඳහා පැයකට ... ... ... | 600 | 0 |

### කුලියට දීම පිළිබඳ කොන්දේසි

(අ) අලියා බෝට්ටුවක් පිටත් කර හැරීමේ දී , එය කුලියට ගන්නා තැනැත්තා විසින් එම අලියා බෝට්ටුව ද එහි නිලධාරීන් , නැවියන් සහ සැල්වේජ් ආම්පන්න ද , කොළඹ වරයා කොමිසමේ වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණ අනුව, රක්ෂණය කිරීමට එකඟ වන ගිවිසුමකට අත්සන් කල යුතු අතර අත්සන් කරන ලද රක්ෂණ ඔප්පුව එකී කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය.

(ආ) නැතිවන හෝ අලාභ සිදුවන සියලුම කප්පි (ගබඩා) බඩු සහ උපකරණ කුලියට ගන්නා තැනැත්තාගේ වියදමින් කොළඹ වරාය කොමිසමේ වරාය කොමසාරිස් සෑහීමට පත්වෙන අයුරින් නැවත සපයා දිය යුතුය. නැතහොත් ආණ්ඩුව විසින් අනුමත කරන ලද ගාස්තු ප්‍රමාණ අනුව ඒ සම්බන්ධයෙන් ඔහුගෙන් අලාභ අය කර ගනු ලැබේ.

(ඇ) මෙ ගාස්තු ගණන් බැලීමේ කාර්‍ය සඳහා, අලියා බෝට්ටුව ක්‍රියාවෙහි යොදන කාලය වශයෙන්, අලියා බෝට්ටුව වරායේ සාමාන්‍ය කටයුතු සඳහා නොයෙදුණ වේලාවේ සිට එකී කටයුතු සඳහා එය ආපසු ලැබුණු වේලාව තෙක් කාලය සැලකිය යුතුය.

### (2) පැකි නැංගුරම් පළවල් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ගාස්තු

3. කොළඹ වරායේ නෞකා ශෝධක තටාකයේ දී නියමු පාලමේ දී හෝ තෙල් තටාකයේ දී හැර යම් පැකි වරාය වේදිකාවක දී හෝ ජැටියකදී සෑම පැය විසි හතරකට හෝ ඉන් කොටසකට යාත්‍රාවේ ලියාපදිංචි කළ ටොන් බර අනුව ටොන් එකකට ශත පහළොව බැගින් ගාස්තුවක් වරාය කොමසාරිස් විසින් අය කළ යුතුය.

1 A—ඒ 12030—5,175 (75/01)

(3) බලොක් ජැටි දියත් මග, බෝට් හවුස් දියත් මග, ටොන් 100 දියත් මග සහ බත්තල් අලුත් වැඩියා කිරීමේ අංගනය පාවිච්චි කිරීම සඳහා ගාස්තු

| | ගාස්තුව රු. ශ. |
|---|---|
| *(1) බලොක් ජැටි දියත් මග, බෝට් හවුස් දියත් මග : | |
| (i) නවතා තැබීමට.— | |
| පළමු දින හතරට හෝ ඉන් කොටසකට ... ... ... ... | 480 0 |
| ඊට පසු දිනකට හෝ ඉන් කොටසකට ... ... ... ... | 180 0 |
| (ii) බොලොක්ක සහ මුක්කු විශේෂයෙන් සපයනු ලැබේ නම් ... ... ... | 125 0 |
| *(2) ටොන් 100 දියත් මග : | |
| (i) නවතා තැබීමට.— | |
| පළමු දින හතරට හෝ ඉන් කොටසකට ... ... ... ... | 1,120 0 |
| ඊට පසු දිනකට හෝ ඉන් කොටසකට ... ... ... ... | 300 0 |
| (ii) බොලොක්ක සහ මුක්කු විශේෂයෙන් සපයනු ලැබේ නම් ... ... ... | 150 0 |
| (3) බත්තල් අලුත් වැඩියා කිරීමේ අංගනය : | |
| පළමු දින හතට හෝ ඉන් කොටසකට ... ... ... ... | 960 0 |
| ඊට පසු දිනකට හෝ ඉන් කොටසකට ... ... ... ... ... | 150 0 |

*දියත් මං බාරව සිටින හෝ ඒවායේ සේවයේ යෙදුණු නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ වැඩ කරන සාමාන්‍ය කාලය වනුයේ පෙ.ව. 7 සිට දහවල් 12 දක්වා සහ ප.ව. 12.30 සිට ප.ව. 4.30 දක්වාය.

දියත් මං පාවිච්චි කිරීම සඳහා කරන ඉල්ලීම් දියත් මග අවශ්‍ය වේලාවට පැය 24 කට කලින් ලියවිල්ලකින් කළ යුතුය. එබඳු ඉල්ලීම් වැඩ කරන සාමාන්‍ය කාලය තුළ කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

වැඩ කරන සාමාන්‍ය වේලාවලින් පිටස්තරව හා සෙනසුරාදා දිනවල හා ඉරිදා දිනවල හා ප්‍රසිද්ධ නිවාඩු දින වල දී කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැරීමට සිදුවන සියළුම වියදම්, දෙපාර්තමේන්තු නඩත්තු ගාස්තු ද ඇතුළත්ව, යාත්‍රාවෙන් අය කරනු ලැබේ.

4) වරාය කොමිෂන් සභාවට අයත් පාවෙන දොඹකර කුලියට දීම

1. දොඹකරයට ඒමට නියම කළ යාත්‍රාව හෝ ජැටිය අද්දරට දොඹකරය පැමිණි වේලාවේ සිට දොඹකරය මත කිසිදු නැව් බඩුවක් නොමැති වන පරිදි කුලියට ගන්නා විසින් අවසන් වරට එය මුදා හරින වේලාව තෙක් කාලය දොඹකරය කුලියට ගත් කාලය වශයෙන් සලකනු ලැබිය යුතුය.

2. කුලී කාල සීමාව තුළ දොඹකරයෙන් ඔසවනු ලබන යම් කිසි බඩුවකට හෝ බඩු මිටියකට නැතහොත් බඩුවකින් හෝ බඩු මිටියකින් කවරාකාර යකින් වුව ද සිදු විය හැකි අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් වරාය කොමසාරිස් වගකීමට යටත් නොවන්නේය.

3. දොඹකරය පාවිච්චි කරනු සඳහා කරනු ලබන ඉල්ලීම් සතියේ දිනක නම් දොඹකරය අවශ්‍ය වෙලාවට යටත් පිරිසෙයින් පැය 12 කට කලින් ද සෙනසුරාදා ඉරිදා හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල දී නම් පැය 24කට කලින් ද, දොඹකරය අවශ්‍ය කුමන ස්ථානයකට ද එනම් නිශ්චිත යාත්‍රාවක වරාය පැත්තෙන් ද නැතහොත් නැවෙන් බසින කවුළුවේ සිට නැව් ඉදිරියේ බලා සිටින විට දකුණු පැත්තේ කුමන තැනක ද එසේත් නැතහොත් කුමන ලක්ෂ්‍යයක් කරා ද යන්න නිවැරදිව සඳහන් කරමින් වරාය යාත්‍රා අධිකාරී වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර වරාය කොමසාරිස්ගේ කාර්යාලයෙන් ඉල්ලා ලබාගත හැකිය.

4. කුලියට ගන්නා විසින් දොඹකරය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මෙහි 11 වන ඡෙදයේ නියමිත ගාස්තු ද, 12 වන ඡෙදයේ දක්වෙන ටොන් බර ගාස්තු ද, බිල ඉදිරිපත් කරන දිනයේ සිට දින 10ක කාල සීමාවක් ඇතුළත ගෙවිය යුතුය.

5. බත්තල්වලට, පාලම් පාරුවලට හෝ කුලී කාලය තුළ එකී දොඹකරයෙන් බානු ලබන බඩු තැබීම සඳහා ලබාගත් වෙනයම් යාත්‍රාවලට සිදුවන යම් අලාභයක් සම්බන්ධයෙන් වරාය කොමසාරිස් හෝ වරාය කොමිසමේ යම් සේවකයකු වග නොකිව යුතුය.

6. දොඹකරය අවශ්‍ය කළ යාත්‍රාවේ පැත්ත කුලී කාලය තුළ දී වෙනත් යාත්‍රාවලින් තොරව තැබීම පිළිබඳව දොඹකරය කුලියට ගන්නා වග කිව යුතුය.

7. පාවෙන දොඹකරය සාමාන්‍යයෙන් සෙනසුරාදා, ඉරිදා හා ප්‍රසිද්ධ නිවාඩු දින ඇතුළුව එක් එක් දිනයේ පෙ. ව. 8.30 සිට ප. ව. 6 දක්වා වූ කාලය අතරේ පාවිච්චි කිරීම සඳහා ලබාගත හැකිය. එසේ වුවද, පෙ. ව. 8.30 ට පෙර හෝ ප. ව. 6.30 ට පසු දොඹකරය කුලියට ගැනීමට අවශ්‍ය විනි නම්, කුලියට ගන්නා විසින් ඒ සඳහා වරාය යාත්‍රා අධිකාරී මගින් එවිය යුතු ලිඛිත ඉල්ලුම් පත්‍රයකින් වරාය කොමසාරිස්ගේ විශේෂ අවසරය ලබාගත යුතුය. ඒ කාල සීමාව තුළ පාවෙන දොඹකරය පාවිච්චි කිරීම සඳහා ගාස්තු මෙහි 11 වන ඡෙදයේ සඳහන් ගාස්තු මෙන් දෙගුණයක් විය යුතුය.

8. කුලියට ගන්නා විසින් දවසේ වැඩ අවසන් වීමෙන් පසු දොඹකරය එය අයත් නැංගුරම් පළ වෙත ගෙන යාමට කටයුතු සැලැස්විය යුතුය. 7 වන ඡෙදයේ දක්වෙන විශේෂ අවසරය ඇතුව මිස, ප. ව. 6 න් පසු කිසිම හේතුවක් නිසා හෝ පාවෙන දොඹකරය යාත්‍රාවේ හෝ වාප්පුවේ පැත්තෙන් තිබීමට අවසර දෙනු නොලැබිය යුතුය.

9. කුලියට ගත් තැනැත්තාගේ සේවකයකුගේ හෝ නියෝජිතයකුගේ නොසැළකිලිමත් ක්‍රියාවක් හේතුවෙන් දොඹකරයට අලාභයක් සිදුවුවහොත්, එය අළුත් වැඩියා කිරීම සඳහා වැය වන සම්පූර්ණ මුදල කුලියට ගන්නා විසින් වරාය කොමසාරිස්ට ගෙවිය යුතුය.

10. පාලම් පාරු දොඹකර යන්ත්‍රය පදවන්නා විසින් එය කුලියට ගත් තැනැත්තාගේ හෝ ඔහුගේ නියෝජිතයාගේ විශේෂ අවශ්‍යතාවයන් අනුව කටයුතු කළ යුතුය. එහෙත් පාලම් පාරු දොඹකරය පදවන්නාගේ මතය අනුව ඔසවනය සුරක්ෂිව යොද නැත්නම් හෝ නිසි පූර්වාරක්ෂක විධිවිධාන යොද ගත නොහැකි නම් ඔහු විසින් පාලම් පාරු දොඹකර යන්ත්‍රය ක්‍රියා කරවීම නතර කළ යුතුය.

11. පාවෙන දොඹකරය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් වන ගාස්තු පහත සඳහන් පරිදි වේ :—

| | රු. ශ. |
|---|---|
| ටොන් 1½ට වැඩි එහෙත් ටොන් 4ට නොවැඩි බරක් සඳහා ටොන් එකකට හෝ ඉන් කොටසකට ... ... | 15 0 |
| ටොන් 4ට වැඩි එහෙත් ටොන් 8ට නොවැඩි බරක් සඳහා ටොන් එකකට හෝ ඉන් කොටසකට ... ... | 20 0 |
| ටොන් 8කට වැඩි එහෙත් ටොන් 15කට නොවැඩි බරක් සඳහා ටොන් එකකට හෝ ඉන් කොටසකට ... ... | 25 0 |
| ටොන් 15කට වැඩි එහෙත් ටොන් 30කට නොවැඩි බරක් සඳහා ටොන් එකකට හෝ ඉන් කොටසකට ... ... | 35 0 |
| ටොන් 30කට වැඩි එහෙත් ටොන් 60ට නොවැඩි බරක් සඳහා ටොන් එකකට හෝ ඉන් කොටසකට ... ... | 50 0 |

එක් එක් එසවීමක් සම්බන්ධයෙන් මිනිත්තු 30ක නිදහස් කාල සීමාවක් අතහැරීමෙන් පසුව, කුලියට ගත් කාල සීමාව සඳහා සෑම පැය භාගයකට හෝ ඉන් කොටසකට රු. 50ක ගාස්තුවකට අමතරව දිනකට අඩු වශයෙන් රු. 150 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

12. පාවෙන දොඹකරයේ තට්ටුව මත ඔසවනය තිබෙන තුරු සහ දොඹකරය කුලියට ගත් තැනැත්තා විසින් පොරොත්තු ගාස්තු ගෙවනු ලබන තුරු එම දොඹකරය කුලියට ගෙන තිබෙන බව සලකනු ලැබිය යුතුය.

13. දොඹකරය ක්‍රියාකාරී ස්ථානයට හෝ ඉන් බැහැරට ඇදගෙන යෑමේ කාර්යය නැව් නියෝජිතයා නැතහොත් කුලියට ගන්නා තැනැත්තා විසින් කරගත යුතුය. අලියා බෝට්ටු කුලිය දොඹකරය ඇදගෙන යෑම සඳහා සාමාන්‍ය උපලේඛනයේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණය අනුව අය කරනු ලැබේ.

සංලක්ෂ්‍යය.—(i) නැවත බඩු එසවීම සඳහා වාප්පුවේ තබා ඇති ඔසවනය සඳහා යාත්‍රාවෙන් බඩු ගොඩ බෑම සඳහා පළමුවරට පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඉහත සඳහන් ගාස්තු ප්‍රමාණ අනුව ද ඊට පසු වාප්පුවෙන් බඩු නැවත එසවීමට පාවිච්චි කිරීමේ දී ඉහත කී ගාස්තු ප්‍රමාණවලින් භාගයක් ද වශයෙන් ගාස්තු අය කරනු ලැබේ.

(ii) පාවෙන දෙඹකරය සඳහා ඇණවුමක් කොට පැ. 4 ක දැන්වීමක් නොකොට ඒ ඇණවුම අවලංගු කරන අවස්ථාවක රු. 120ක ගාස්තුවක් ගෙවිය යුතුය.

(iii) සෙනසුරාද දිනවල, ඉරිදා දිනවල හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල පාවෙන දෙඹකරයක් අවශ්‍ය වුවහොත්, කුලියට ගන්නා විසින් ඉහත සඳහන් 4 වන ඡේදයේ ප්‍රකාර, තමාට එය අවශ්‍ය වන වේලාවට යටත් පිරිසෙයින් පැය 48කට කලින් වරාය යාත්‍රා අධිකාරි වෙත ලියවිල්ලකින් ඉල්ලුම් කළ යුතුය. එබඳු දිනවල දී දෙඹකරය පාවිච්චි කිරීම සඳහා ගාස්තු 11 වන ඡේදයේ සඳහන් ගාස්තු ප්‍රමාණය මෙන් දෙගුණයක් විය යුතුය.

### (5) කොළඹ දී තෙල් පහසුකම්

1. කොළඹ දී තෙල් පහසුකම් සැලසීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ගාස්තු අය කරනු ලැබේ :—

(1) ආනයනය කළාවූ ද, අපනයනය කළාවූ ද, තොග වශයෙන් වරායේ දී නැවත නැව් පැටෙව්වාවූ ද සියළුම ඛණිජ තෙල් නිෂ්පාදන සම්බන්ධයෙන් ගැලුම් 1,000ට හෝ ඉන් කොටසකට—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) අමුතෙල් ... ... ... ... ... | 8 | 0 |
| (ආ) වෙනත් ඛණිජ තෙල් නිෂ්පාදන ... ... ... ... ... | 16 | 0 |

(2) තොග වශයෙන් අපනයනය කරනු ලබන සියලුම පොල්තෙල් සම්බන්ධයෙන්—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) තෙල් ටොන් එකකට හෝ ඉන් කොටසකට ... ... ... ... | 22 | 0 |
| (ආ) සෙනසුරාද දිනවල, ඉරිදා දිනවල, ප්‍රසිද්ධ නිවාඩු දිනවල හෝ වෙනත් දිනවල වැඩ කරන සාමාන්‍ය වේලාවට පිටස්තර වේලාවල දී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය යොදවන විටක පැයකට හෝ ඉන් කොටසකට අය කරන අමතර ගාස්තුව ... ... ... ... ... | 60 | 0 |
| (ඇ) පොල් තෙල් සාම්පල විශ්ලේෂණය කිරීම සඳහා හා තෙල්වල අඩංගු මේද, ඇසිඩ්, තෙතමනය, අපිරිසිදුතාවය හා වර්ණය පිළිබඳ නියම වටිනාකම විශෙෂයෙන් දැක්වෙන වර්ග සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු ... | 30 | 0 |

මෙම නියෝගයෙහි—

'සාමාන්‍ය වැඩ කරන වේලාවල්' යනුවෙන් වැඩ කරන සියලුම දිනවල පෙ. ව. 7 සිට දහවල් 12 දක්වා හා ප. ව. 12.30 සිට ප. ව. 4.30 දක්වා කාලය අදහස් වේ.

(3) අතිකාල වේලාවල දී, සෙනසුරාද දිනවල, ඉරිදා දිනවල, ප්‍රසිද්ධ නිවාඩු දිනවල සහ සාමාන්‍ය වැඩ කරන වේලාවලින් බාහිරව තොග තෙල් යන්ත්‍රස්ථානවල දී පොල් තෙල් භාර ගැනීමට පැයකට හෝ ඉන් කොටසකට රු. 90 ක්වූ ගාස්තුවක් ගෙවිය යුතුය.

2. තෙල් තටාකය දිගට නැංගුරම් ලන ලද යාත්‍රා සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු පහත සඳහන් ප්‍රමාණ අනුව නිශ්චය කළ යුතුය :—

(1) ඉන්ධන තෙල් සැපයීමේ කාර්‍ය්‍ය සඳහා—

| | රු. | ශ. |
|---|---|---|
| පළමුවන පැය හතරට හෝ ඉන් කොටසකට ... ... ... ... ... | 325 | 0 |
| ඊට පසු එක පැයකට හෝ ඉන් කොටසකට ... ... ... ... ... | 65 | 0 |

(2) තොග වශයෙන් ඛණිජ තෙල් ගොඩබෑමේ හෝ පැටවීමේ කාර්‍ය්‍ය සඳහා—

| | රු. | ශ. |
|---|---|---|
| පළමුවන පැය හයට හෝ ඉන් කොටසකට ... ... ... ... ... | 150 | 0 |
| පැය හයකට වැඩි එහෙත් පැය දෙළහකට නොවැඩි කාලයකට ... ... ... | 325 | 0 |
| පැය දෙළහකට වැඩි එහෙත් පැය දහ අටකට නොවැඩි කාලයකට ... ... ... | 490 | 0 |
| පැය දහ අටකට වැඩි එහෙත් පැය විසි හතරකට නොවැඩි කාලයකට ... ... ... | 650 | 0 |
| එක් එක් අමතර පැය හයකට හෝ ඉන් කොටසකට ... ... ... ... | 85 | 0 |

(3) නැව් බඩු බෑම් හා පැටවුම් කාර්‍ය්‍යයක් සඳහා සෑම පැය 24කට හෝ ඉන් කොටසක් සඳහා යාත්‍රාවේ දළ ලියාපදිංචි ටොන් ප්‍රමාණය එක් එක් ටොන් එකක් සඳහා ... ... ... ... ... 0 15

(1) වන හා (2) වන අනුඡේද යටතේ ගෙවිය යුතු ගාස්තු—

(අ) කොළඹ වරාය කොමිෂන් සභාවේ වරාය කොමසාරිස්ගේ විශේෂ අවසරය ඇතිව යම් යාත්‍රාවක් වෙනත් නැංගුරම් පළකට නොගොස් තෙල් ජැටි දිගේ නතර කොට ඇති යම් කාල සීමාවක් සම්බන්ධයෙන් ද,

(ආ) බර දැමීම පිණිස පැට්‍රෝල් හිස් කිරීමෙන් පසු යාත්‍රාවක් තෙල් ජැටි දිගේ නතර කර තිබෙන මුල් පැය හය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් ද,

අය කරනු නොලැබිය යුතුය.

(4) සෙනසුරාද දිනවල, ඉරිදා දිනවල හා ආණ්ඩුව මගින් කලින් කල ප්‍රකාශයට පමුණුවන ලද ප්‍රසිද්ධ නිවාඩු දිනවල ද වෙනයම් දිනක ප.ව. 6 සහ පෙ.ව. 6 අතර කාලය ඇතුළත ද තෙල් ජැටි දිගේ නතර කර තිබෙන යාත්‍රා සම්බන්ධයෙන් පහත දැක්වෙන ගාස්තු ප්‍රමාණ අනුව තීරණය කෙරෙන අමතර ගාස්තුවක් අය කළ යුතුය :—

| | රු. | ශ. |
|---|---|---|
| සෑම පැය හයක හෝ ඉන් කොටසක කාල සීමාවක්ම සඳහා ... ... ... | 25 | 0 |

(5) තෙල් ඉවත් කිරීම සඳහා හෝ ඉන්ධන ගැනීම සඳහා ජැටි දිගේ යාත්‍රාවක් නතර කළ විටක, තෙල් ජැටිවලට ගොඩ බාන හෝ ඉන් පටවන යම් නැව් බඩු සම්බන්ධයෙන් මිටියකට ශත 20 බැගින් ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය. එසේ වුව ද, බඩු බෑම හා පැටවීම අයථා පරිදි පමාවී ඇති බැව් කොළඹ වරාය කොමිෂන් සභාවේ වරාය කොමසාරිස් ගේ මතය වුවහොත් 2 වන නියෝගයේ 2 වන උපඡේදයේ නියමිත ගාස්තු ප්‍රමාණය අනුව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් අය කිරීම සඳහා බලය පැවරීමට ඔහුට හැකිය.

### (6) වරාය කොමිෂන් සභාව සතු දෙඹකර පාවිච්චි කිරීම සඳහා ගාස්තු

1. වරාය කොමිෂන් සභා ප්‍රදේශයේ තිබෙන දොඹකර පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ගාස්තු අය කරනු ලැබේ :—

| දොඹකර වර්ගය | සාමාන්‍ය වැඩ කරන වේලාවල් තුළ අයකරන ගාස්තු |
|---|---|
| නැව් ශෝධක තටාකයේ ටොන් 30 ගමන්කාරී වාෂ්ප දොඹකරය (බලොක් ජැටියේ ටොන් 30 (යෝධ) දොඹකරය විශේෂ කටයුතු සඳහා ලබාගත හැකිය.) | පළමුවන එසවීමට රු. 200 ක් ද, ඊට පසු එදිනම ඔසවන සෑම ටොන් එකකට හෝ ඉන් කොටසකට රු. 15 බැගින් ද, එක් එසවීමකට රු. 200 වැඩිම ගාස්තුවක් ද, රු. 50 අඩුම ගාස්තුවක් ද අය කරනු ලැබේ. ඊට අමතර වශයෙන් දොඹකරය නතර කර තබා ගැනීම සඳහා පැය $\frac{1}{4}$ට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් අය කරනු ලැබේ. |
| ටොන් 20 කටාක සීමාස්ථ විදුලිය දොඹකරය ... | පළමුවන එසවීම සඳහා රු. 100 බැගින් ද, ප්‍රධාන ඔසවනයක් සමග පසුව කෙරෙන එක් එක් එසවීම සඳහා රු. 80 බැගින් ද, අමතර ඔසවනයක් සමග පසුව කෙරෙන එක් එක් එසවීම සඳහා රු. 65 බැගින් ද, අය කරනු ලැබේ. පැය $\frac{1}{4}$ කට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් පොරොත්තු ගාස්තු වශයෙන් අය කරනු ලැබේ. |
| ටොන් 5 දක්වා වූ ජංගම දොඹකර ... | පැයකට හෝ ඉන් කොටසකට රු. 20 |
| ටොන් 5ට වැඩි ටොන් 15ට අඩු ජංගම දොඹකර ... | පැයකට හෝ ඉන් කොටසකට රු. 30 |
| ටොන් 15 සහ ඊට වැඩි එහෙත් ටොන් 25ට අඩු ජංගම දොඹකර | පැයකට හෝ ඉන් කොටසකට රු. 35 |
| ටොන් 25 හෝ ඊට වැඩි ජංගම දොඹකර ... | පැයකට හෝ ඉන් කොටසකට රු. 40 |
| ටොන් 5 දක්වා වූ විදුලිය වාෂ්පු දොඹකර හා වාෂ්ප දොඹකර | පැයකට හෝ ඉන් කොටසකට රු. 17 |
| පෝර්ටල් දොඹකර ... ... | පැයකට හෝ ඉන් කොටසකට රු. 30 |

**ඉහත සඳහන් ගාස්තු ප්‍රමාණ අදාළ වනුයේ, වරාය ප්‍රදේශය තුළ වරාය පහසුකමක් වශයෙන් දොඹකර පාවිච්චි කරන විටක පමණි.**

වරාය පහසුකමක් වශයෙන් නොවන වෙනත් ආකාරයකට පෞද්ගලික තැනැත්තන් විසින් වරාය භූමිය තුළ දොඹකර පාවිච්චි කරන විටක ඉහත කී ප්‍රමාණය මෙන් දෙගුණයක ගාස්තු ප්‍රමාණයක් අය කරනු ලැබේ.

ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා ආණ්ඩුවේ අනුග්‍රහ ලත් නීතිගත සංස්ථා විසින් වරාය භූමියෙන් පිටත දොඹකර පාවිච්චි කරන විටක ගාස්තු ප්‍රමාණය, ඉහත සඳහන් ගාස්තු ප්‍රමාණය මෙන් 1½ක් අය කරනු ලැබේ.

පෞද්ගලික තැනැත්තෙකු විසින් වරාය භූමියෙන් පිටත දොඹකර පාවිච්චි කරන විටක ගාස්තු ප්‍රමාණය, ඉහත සඳහන් ප්‍රමාණය මෙන් තෙගුණයක් අය කරනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—(1) සෙනසුරාද දින, ඉරිදු දින, ප්‍රසිද්ධ නිවාඩු දිනවල හෝ වෙනත් දිනවල සාමාන්‍ය වැඩ කරන වේලාවෙන් පිටත වේලාවන් තුළ පාවිච්චි කිරීම සඳහා සාමාන්‍ය වැඩ කරන වේලාවන් සඳහා නියමිත ප්‍රමාණය මෙන් දෙගුණයක් අය කරනු ලැබේ.

(2) වැඩ කරන ස්ථානයට යාමට හා ඒ ස්ථානයේ සිට ඒමට ගතවන කාලය සඳහා කුලියට ගන්නා තැනැත්තාගෙන් ගාස්තු අය කළ යුතුය.

(3) විශේෂ කටයුතු සඳහා ලබාගත හැකි බවට නියමිත ටොන් 30 දොඹකරය සහ ටොන් 20 දොඹකරය කුලියට ගන්නා අවස්ථාවක දී, නතර කර තබා ගැනීමේ ගාස්තු ගණන් බලන විට එක් එක් එසවුම වෙනුවෙන් මිනිත්තු 30ක නිදහස් කාලයක් ඉඩ හරිනු ලැබේ.

(4) දොඹකර කුලියට දීම සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසිවලට යටත්ව දොඹකර කුලියට දීම කරනු ලැබිය යුතුය.

දොඹකර කුලියට දීම පහත සඳහන් කොන්දේසි යටතේ කරනු ලැබේ :—

(1) **පහත සඳහන් නියමයන් උඩ දොඹකර කුලියට දෙනු ලැබේ :**

(අ) දොඹකර කුලියට ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම්, බැග්ඩෑඩ් පෙදෙසේ දොඹකර කාර්යාලයෙන් ලබාගත යුතු නියමිත ආකෘති පත්‍රයේ උප පත්‍රිකාවේ ලියා, කුලියට ගන්නා විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් අත්සන් කොට ඉදිරිපත් කළ යුතුය.

(ආ) (ඇ) ඡෙදයේ සඳහන් දොඹකර නොව බලයලත් දොඹකර සඳහා කෙරෙන සියලුම ඉල්ලීම්, එසේ අවශ්‍ය දොඹකර නවතා ඇති අංශ පිළිවෙළින් භාරව සිටින දොඹකර පිළිබඳ වාෂ්ප අධිකාරී හෝ (රට අභූරු බිම් භාර) වාෂ්ප අධිකාරී වෙත පළමුවෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඒවා දොඹකර කාර්යාලයට භාර දිය යුතුය.

(ඇ) නැව් ශෝධක තටාකයේ ඇති ටොන් 30 ගමන්කාරී වාෂ්ප දොඹකරය කුලියට ගැනීම සඳහා කරන ඉල්ලීම් තටාක සහ දියත් මග පිළිබඳ පෝර්මන් වෙත ද, බ්ලොක් ජැටියේ ටොන් 30 ගොලියත් දොඹකරය සහ වරාය නිර්මාණ සහ නැව් ශෝධක තටාකය අතර ධාවනය කරන ටොන් දහයේ ජංගම වාෂ්ප දොඹකරය සඳහා කරන ඉල්ලීම් අධිකාරී යාන්ත්‍රික ඉංජිනේරු වෙත ද ඉදිරිපත් කළ යුතුය.

(i) **සාමාන්‍ය වේලාවල් තුළ දී—**

දොඹකර කුලියට ගැනීම සඳහා සාමාන්‍ය වේලාවලදී කරන ඉල්ලීම්, බැග්ඩෑඩ් පෙදෙසේ දොඹකර කාර්යාලයේ දී හෝ අවස්ථා චෝචිත පරිදි තටාක සහ දියත් මං පෝමන්ගේ හෝ අධිකාරී යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ කාර්යාලයේ දී, එසේ දොඹකර අවශ්‍ය කරන දිනයට කලින් දින ප.ව. 2 දක්වා භාරගනු ලැබේ.

මෙම ඡෙදයෙහි 'සාමාන්‍ය වේලාවල්' යනුවෙන් සෙනසුරාද දින, ඉරිදු දින හා ප්‍රසිද්ධ නිවාඩු දින හැර දහවල් 12 සිට ප.ව. 12.30 දක්වා පැය ½ක විවේක කාලයක් සහිතව පෙ.ව. 7 සිට ප.ව. 4.30 දක්වා වූ කාලය අදහස් වේ.

(ii) **සාමාන්‍ය වේලාවල් නොවන වෙනත් වේලාවල් තුළ දී—**

(අ) සාමාන්‍ය සති දිනවල ඉල්ලීම්, අවස්ථාචෝචිත පරිදි (බැග්ඩෑඩ්හි) දොඹකර කාර්යාලයේ දී හෝ තටාක සහ දියත් මං පෝර්මන් ගේ හෝ අධිකාරී යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ කාර්යාලයේ දී, එසේ දොඹකර අවශ්‍ය කරන දින ප.ව. 2 දක්වා භාරගනු ලැබේ.

(ආ) සෙනසුරාද සහ ඉරිදු දිනවල ඉල්ලීම්, අවස්ථාචෝචිත පරිදි (බැග්ඩෑඩ්) දොඹකර කාර්යාලයේ දී, තටාක සහ දියත් මං පෝර්මන් ගේ හෝ අධිකාරී යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ කාර්යාලයේ දී, දොඹකර අවශ්‍ය දින ප.ව. 12.30 දක්වා භාරගනු ලැබේ.

(ඇ) ප්‍රසිද්ධ නිවාඩු දිනවල ඉල්ලීම්, දොඹකර කාර්යාලයේ දී හෝ තටාක සහ දියත් මං පෝර්මන්ගේ කාර්යාලයේ දී හෝ අධිකාරී යාන්ත්‍රික ඉංජිනේරු තැනගේ කාර්යාලයේ දී, නිවාඩු දිනට කලින් දින ප.ව. 1.30 දක්වා භාරගනු ලැබේ.

(2) **දොඹකර වෙන් කොට භාර දීම :**

(අ) දොඹකර සැපයීම හා ඒවා කුලියට දීමේ කාල සීමාව සීමා කිරීමේ අයිතිය කොළඹ වරාය කොමිෂන් සභාව වෙත පැවරේ.

(ආ) යම් විටක යම් දොඹකරයක් යම් අයදුම්කරුවකුට සැපයීමට කොළඹ වරාය කොමිෂන් සභාව බැඳී නොසිටිය යුතුය.

(ඇ) වරායේ වැඩ කටයුතු සඳහා අවශ්‍යතාවක් පැන නැගුණොත් දොඹකර නැවත වෙන්කරදීම හෝ දොඹකරයක් කුලියට ගත් තැනැත්තකුගෙන් ආපසු ගැනීම, වරාය කොමිෂන් සභාව විසින් ඕනෑම විටක කළ හැකිය.

(3) **වෙනස් කිරීම් හා අවලංගු කිරීම් :**

(අ) දොඹකර වෙන් කරවා ගැනීම සම්බන්ධ වෙනස් කිරීම් හෝ අවලංගු කිරීම් මෙහි ඉහත දක්වූ (1) (i) හා (1) (ii) (අ), (ආ) හා (ඇ) ඡෙදවල සඳහන් කාල තෙක් කුලියට ගන්නා විසින් වියදමක් නොමැතිව බාර ගත යුතුය. එහෙත් ඒ කාලවලට පසුව වෙනස් කිරීම් හෝ අවලංගු කිරීම් කිසිවක් බාර නොගන්නා අතර එකී දොඹකර පාවිච්චි කළාවූ ද ඒවා වෙන්කරවා තැබූ මුළු කාලය වෙනුවෙන් සම්පූර්ණ කුලිය කුලියට ගන්නා තැනැත්තාගෙන් අය කළ යුතුය.

(ආ) ඒ සියලුම වෙනස් කිරීම් හා අවලංගු කිරීම් ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(ඇ) පිළිවෙළින් සාමාන්‍ය හා අතිකාල වේලාවන් තුළ කුලියට වෙන් කරවා ගත් දොඹකර සම්බන්ධයෙන් අවලංගු කිරීමේ ඇණවුම වෙනම කළ යුතුය.

(4) **කුලී කාල සීමාව දික් කිරීම :** ඉල්ලා සිටි කාල සීමාවට වඩා දික්වන කාල සීමාවක් සඳහා දොඹකර අවශ්‍යවන අවස්ථාවක සාමාන්‍ය වේලාවන් තුළදී නම් මුල් ඉල්ලීමේ සඳහන් වන කාල සීමාව ඉක්මවීමෙන් යටත් පිරිසෙයින් පැයකටවත් කලින් හා අතිකාල වේලාවන් තුළදී නම් ප.ව. 9 ට කලින් ද අලුත් ඉල්ලීමක් කළ යුතුය.

(5) **ගාස්තු ගෙවීම :**

(අ) කොළඹ වරාය කොමිෂන් සභාවේ ගණකාධිකාරී විසින් ඉල්ලුම්කරුගෙන් සෑහෙන ඇප මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා මිස කිසියම් දොඹකරයක් යම් අනියම් පාවිච්චි කරන්නෙකුට සපයනු නොලැබිය යුතුය.

(ආ) ඉහත කී නියමය, කොළඹ වරාය කොමිෂන් සභාව වෙත තමන්ගේ නමින් ඇති තැන්පත් මුදල අනුව දොඹකර කුලියට ගැනීමට අවසර ඇති නොකඩවා කුලියට ගන්නන්ට අදාළ නොවිය යුතුය.

(6) **කුලියට ගන්නාගේ වගකීම :**

(අ) දොඹකරයේ සහ සේවක පිරිසේ ආරක්ෂාව සම්බන්ධයෙන් 'කුලියටගන්නා' වග කිව යුතු අතර තමා කුලියට ගත් කාලය තුළ එය ක්‍රියා කරවීමේ දී යම් තැනැත්තෙකුට හෝ යම් පෙළකට වන හානියක්, අලාභයක් හෝ වෙනත් යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වරාය කොමසාරිස් නිදහස් විය යුතුය. තව ද, කුලියට ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා විසින් ඒ දොඹකරයට අදාළ වන ආරක්ෂාව හා පැටවුම් බර පිළිබඳ නියෝග අනුගමනය කරන බවට සහතික කළ යුතුය.

(ආ) නිර්මාණාත්මක, යාන්ත්‍රික, විදුලිමය හෝ ඇන්ජිමේ ඇණහිටවීමකින් හෝ වෙනත් කුමන හේතුවකින් පැන නැගිය හැකි ප්‍රමාදයක් හෝ වෙනත් යම් ප්‍රතිඵලයක් සම්බන්ධයෙන් කොළඹ වරාය කොමිෂන් සභාව වග නොකිය යුතුය.

(ඇ) දොඹකරයේ නියමුවා විසින් කුලියට ගන්නා තැනැත්තාගේ නියමයන් පිළිපැදිය යුතුය. එහෙත් දොඹකරයේ නියමුවාගේ මතය අනුව කුලියට ගන්නා තැනැත්තා විසින් ආරක්ෂක හා නිසි විධිවිධාන සලස්වා නැති බව පෙනී යතහොත් ඔහු විසින් දොඹකරය ක්‍රියා කරවීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(7) **දොඹකරවල ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා යෙදිය යුතු විධිවිධාන :**

(අ) කිසියම් දොඹකරයක, එහි නියමිත ක්‍රියාකාරී අරය සම්බන්ධයෙන් වන ආරක්ෂා පැටවුම් බර නොඉක්මවිය යුතුය.

(ආ) දොඹකරයේ ඇමුණුම් කොක්ක ශිරස් අතට වළලු උඩින් එහා මෙහා කළ හැකිවන පරිදී ඒ වළලු සියලු බාධකවලින් පැහැදිලිව තොරව සුදුසු තන්හි තැබිය යුතුය.

(8) විශේෂ කාර්‍ය්‍යය සඳහා ලබා ගත හැකි වාෂ්ප දෙඹකරයේ වෙන් කරවා කිසියම් එසවුමක් නොකොට පසුව ඇණවුම් අවලංගු කරනු ලබන අවස්ථාවක, ඒ දෙඹකරයේ පළමු එසවුම සම්බන්ධයෙන් නියමිත ගාස්තුවට සමාන ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය. ඊට අමතරව දොඹකරය නතර කර තබා ගතහොත් ඒ කාල සීමාව වෙනුවෙන් ද අය කිරීමක් කළ යුතුය.

(9) 'එසවුමක්' යන්නට එසවුම් බර සමතෝලනය කිරීමට යෙදෙන සීරු මාරු කිරීම ගණන් ගනු නොලැබ නැව් බඩු හෝ බඩු මිටි හෝ තොගයක් එක් බෝට්ටුවකින් හෝ යාත්‍රාවකින් වෙරළට හෝ වෙනත් යාත්‍රාවලට හෝ ගොඩබිම සිට වාහනයකට හෝ ඉන් බිමට හෝ ඔසවා තැබීම ඇතුළත් වේ.

විවිධ

මෙ පරිච්ඡෙදයේ—

(i) 'නිවාඩු දින' යන්නෙන් සියලුම සෙනසුරාද දිනවල්, ඉරිද දිනවල් හා ආණ්ඩුව මගින් කලින් කලට ප්‍රකාශයට පත් කරන ලද ප්‍රසිද්ධ නිවාඩු දින අදහස් වේ.

(ii) කොළඹ වරාය කොමිසම පිළිබඳව සාමාන්‍ය වැඩ කරන වේලාවල් යන්නෙන් වෙනත් ආකාරයක් සඳහන් කර ඇතහොත් මිස පෙ.ව. 7 සිට දවල් 12 සහ ප.ව. 12.30 සිට ප.ව. 4.30 දක්වා වූ කාලය අදහස් වේ.

(7) කොළඹ වරාය කොමිසම — දුම්රිය ඇන්ජින් යනාදිය

1. එහා මෙහා තල්ලු කිරීමට හැර වෙනත් කාර්‍ය්‍ය සඳහා දුම්රිය ඇන්ජින් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අය කෙරෙන ගාස්තු—

(අ) සාමාන්‍ය වැඩ කරන දිනවල :

| | රු. | ශ. |
|---|---|---|
| පැය 6ක කාලයකට හෝ ඉන් කොටසකට ... ... ... ... ... | 140 | 0 |
| පැය 6කට වැඩි එහෙත් පැය 12 කට නොවැඩි කාලයකට ... ... ... ... | 280 | 0 |
| පැය 12 කට වැඩියෙන් වන සෑම අමතර පැයකට හෝ ඉන් කොටසකට ... ... ... ... | 25 | 0 |

(ආ) සෙනසුරාද දිනයන්හි දී, ඉරිද දිනයන්හි දී, නිවාඩු දිනවල දී හා රජය මගින් විටින් විට ප්‍රකාශයට පමුණුවන ලබන ප්‍රසිද්ධ නිවාඩු දිනවල හා වැඩ කරන සාමාන්‍ය දිනවල වැඩ කරන නියමිත වේලාවලින් පසුව මෙහි ඉහත (අ) හි නියමිත ගාස්තු 100%ක් වැඩි කරනු ලැබේ.

2. එහා මෙහා තල්ලු කිරීමේ ගාස්තු පහත දැක්වෙන අයුරු වේ :—

එක තල්ලුවකට රු. 60 බැගින් ද, සෙනසුරාද, ඉරිද, ප්‍රසිද්ධ නිවාඩු දින සහ ආණ්ඩුව මගින් විටින් විට ප්‍රකාශයට පමුණුවනු ලබන ප්‍රසිද්ධ නිවාඩු දිනවල කරනු ලබන වැඩ සඳහා ගාස්තුවේ 100%ක් ද ඊට එකතුව අය කරනු ලැබේ.

3. වැගන් රථ, ට්‍රොලි රථ සහ ට්‍රක් රථ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ගාස්තු:—

රථයක් වෙනුවෙන් දිනකට හෝ ඉන් කොටසකට—රු. 30.

(8) යාන්ත්‍රික මෙවලම්

| යන්ත්‍රාගාරය | | | සාමාන්‍ය වැඩකරන වේලාවල් තුළ අය කෙරෙන ගාස්තු රු. | ශ |
|---|---|---|---|---|
| (කළු තෙලින් ක්‍රියා කෙරෙන) දෙපැත්තට දිවෙන ස්කූපය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 20 | 0 |
| (පැට්‍රෝල්වලින් ක්‍රියා කෙරෙන) ඩම්පරය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 20 | 0 |
| (පැට්‍රෝල්වලින් ක්‍රියා කෙරෙන) ඇදගෙන යන මෝටරය සහ ඇමුණුම් රථ හය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 10 | 0 |
| (පැට්‍රෝල්වලින් ක්‍රියා කෙරෙන) පෝක් ලිප්ට් ට්‍රක් රථය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 15 | 0 |
| (බැටරිවලින් ක්‍රියා කෙරෙන/කළු තෙලින් ක්‍රියා කෙරෙන) පෝක් ලිප්ට් ට්‍රක් රථය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 10 | 0 |
| (බැටරිවලින් ක්‍රියා කෙරෙන) වේදිකා ට්‍රක් රථ | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 6 | 0 |
| (විදුලි බලයෙන් ක්‍රියා කෙරෙන) බේල් ස්ටැකරය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 10 | 0 |
| (භූමි තෙලෙන් ක්‍රියා කෙරෙන) බූම් කොන්වේයර් ස්ටැකරය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 10 | 0 |
| (විදුලි බලයෙන් ක්‍රියා කෙරෙන) බූම් කොන්වේයර් ස්ටැකරය | —පැයකට හෝ ඉන් කොටසකට | ... | 5 | 0 |

**සංලක්ෂ්‍යය.**—සෙනසුරාද, ඉරිද හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල දී අනිකුත් වැඩ කරන දිනවල වැඩ කරන සාමාන්‍ය වේලාවලින් බැහැර එක් යන්ත්‍රාගාර පාවිච්චි කරතහොත් ඉහත කී ගාස්තු 100%කින් වැඩි විය යුතුය.

වෙනත් උපකරණ සඳහා ගාස්තු නියම කිරීම වරාය කොමසාරිස් විසින් කරනු ලැබේ.

(9) කොච්චිකඩේ රට අඟුරු බිමෙහි තිබෙන යන්ත්‍රානුසාරයෙන් එහා මෙහා කරන රට අඟුරු යන්ත්‍රාගාරය පාවිච්චි කිරීමෙන් ජිප්සම් මැටි එහා මෙහා කිරීම

ටොන් එකක් හෝ ඉන් කොටසක් එහා මෙහා කිරීම සඳහා ගාස්තුව රු. 7 විය යුතුය. මේ ගාස්තු ප්‍රමාණය වැඩ කරන (සාමාන්‍ය) වේලාවලින් බැහැර වේලාවල දී, සෙනසුරාද, ඉරිදි සහ ප්‍රසිද්ධ නිවාඩු දිනවල දී 100%කින් වැඩි කරනු ලැබේ.

අවශ්‍ය කරන අවස්ථාවල දී ඩැහැගැනුම් (ග්‍රැබ්ස්) හා සේවක නඩත්තු කණ්ඩායම් සැපයීම් සඳහා අතිරේක ගාස්තුවක් අය කරනු ඇත.

**සංලක්ෂ්‍යය.**—මේ ගාස්තු ප්‍රමාණයට වරාය (නැව් බඩු) නීතිගත සංස්ථාවට ගෙවිය යුතු නියමිත කුලිය හෝ අනිකුත් ගාස්තු ඇතුළත් නොවේ.

(10) ගල් අඟුරු යන්ත්‍රානුසාරයෙන් එහි වෙන්කිරීම

සීලෝ බක්කියෙන් ගල් අඟුරු එහා මෙහා කිරීම සඳහා ටොන් එකකට හෝ ඉන් කොටසකට රු. 8.50 බැගින් අය කරනු ලැබිය යුතුය. වැඩ කරන සාමාන්‍ය වේලාවලින් බැහැරව හා සෙනසුරාද, ඉරිද හා නිවාඩු දිනවල මේ ගාස්තු ප්‍රමාණය 100% කින් වැඩි කරනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—වරාය (නැව්බඩු) නීතිගත සංස්ථාවට ගෙවිය යුතු නිත්‍ය කුලී හෝ වෙනත් ගාස්තු මේ ගාස්තු ප්‍රමාණයට ඇතුළත් නොවේ.

(11) වැලි කට්ටුවක් ඇතිරීම

කොළඹ වරායේ බිටුමන් තාර තොගයක් ගොඩ බාන විට එකී බිටුමන් තාර ගොඩබෑමට අවශ්‍ය අඟලක් ඝනකමට දැමිය යුතු වැලි ඇතිරිල්ල සඳහා වරාය කොමසාරිස් විසින් වර්ග අඩි සියයකට හෝ ඉන් කොටසකට රුපියල් 7.50 බැගින් ගණන් බැලූ ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය.

(12) වැවේ සිට වරාය තෙක් ඇති ඇළ කපොලු

වැවේ සිට වරාය තෙක් ඇති ඇළ කපොලු යාත්‍රා අයිතිකරුවන්ගේ ඉල්ලීම පිට විවෘත කොට තැබීම සඳහා පහත සඳහන් ගාස්තු අය කරනු ලැබිය යුතුය:—

| | එක් වෙන් කිරීමකට රු. | ශ. |
|---|---|---|
| (1) සෙනසුරාද, ඉරිද සහ ප්‍රසිද්ධ නිවාඩු දින හැර අනිකුත් දිනවල පෙ.ව. 7 සිට ප.ව. 10 තෙක් ... ... | නොමිලේ | |
| (2) සෙනසුරාද, ඉරිද සහ ප්‍රසිද්ධ නිවාඩු දිනවල පෙ.ව. 7 සිට ප.ව. 10 තෙක් පැය 8ට හෝ ඉන් කොටසකට ... | 80 | 0 |
| (3) සෙනසුරාද, ඉරිද සහ ප්‍රසිද්ධ නිවාඩු දින ඇතුළු සියලුම දින ප.ව. 10 සිට පෙ.ව. 7 තෙක් හෝ ඉන් කොටසකට ... | 80 | 0 |

ඇළ කපොලු පාවිච්චි කිරීම සඳහා ඉල්ලුම් කරන ඉල්ලුම්කරු සංඛ්‍යාව එක් අයකුට වඩා වැඩි වෙතොත් ඇළ කපොලු ඇත්ත වශයෙන් පාවිච්චි කරන යාත්‍රා සංඛ්‍යාව ගැන නොතකා ගාස්තුව ඔවුනතර සමානව බෙදනු ලැබිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—සාන්ත සෙබස්තියන් කපොලු පාවිච්චි කිරීම සඳහා අය කෙරෙන ගාස්තු රේන්ද ආඥපනතේ විධිවිධානවලට අනුකූලව විය යුතුය.

(13) දම්වැල් පරීක්ෂා කිරීම

විෂ්කම්භය අඟල් 1ක් හෝ ඊට වැඩි දම්වැලක් පරීක්ෂා කිරීම සඳහා ගාස්තුව පරීක්ෂණයකට රු. 25ක් විය යුතුය.

දම්වැලේ විෂ්කම්භය අඟල් 1ට වඩා අඩු වුවොත් පරීක්ෂණ 3ට හෝ ඊට අඩු සංඛ්‍යාවකට රු. 45 ක් විය යුතුය.

දම්වැල් පරීක්ෂා කිරීම සාමාන්‍ය වැඩ කරන දිනවල දී සාමාන්‍ය වැඩ කරන වේලාවල් තුළ පමණක් කරනු ලැබේ. දම්වැල ලබාගැනීම හා බාරදීම ප්‍රධාන ඉංජිනේරු වැඩපලේ බොයිලේරු අංශයේ ඉංජිනේරු තැන වෙත කළ යුතුය.

### (14) රේඩියෝ ටැලිපෝන් උපකරණ

1. ප්‍රාදේශික ඇමතුම් සම්බන්ධයෙන් ටැලිපෝන් උපකරණ පාවිච්චි කරන හැම දිනකටම හෝ ඉන් කොටසකට අය කරන ගාස්තුව රු. 15 බැගින් විය යුතුය.

2. බාහිර ඇමතුම් සම්බන්ධයෙන්, (192 වන අධිකාරය) විදුලි සංදේශ ආඥපනත යටතේ සම්පාදිත නියෝගවල සඳහන් වන පරිදි බාහිර ඇමතුම් සඳහා වන ගාස්තු ප්‍රමාණය අනුව අය කළ යුතුය.

3. ගාල්ල සහ ත්‍රිකුණාමල වරායයන් සඳහා කොළඹ වරාය සඳහා වන ගාස්තු අදළ වේ.

**සංලක්ෂ්‍යය.**—(අ) වැඩපළට හා වැඩපළෙන් බැහැරට උපකරණ ප්‍රවාහණය කිරීම, කුලියට ගන්නා විසින් තමාගේ වියදමින් පිළියෙල කරගත යුතුය.

(ආ) උපකරණ කුලියට ගෙන ගොස් ඒවා ආපසු ගෙනැවිත් බාරදෙන තෙක් ඒවාට සිදුවිය හැකි හානියක් සම්බන්ධයෙන් කුලියට ගන්නා වගකිව යුතුය.

(ඇ) කොළඹ වරාය කොමිෂන් සභාවේ ගණකාධිකාරී වෙත සෑහෙන තැන්පත් අත්තිකාරමක් තබතහොත් පමණක් මේ උපකරණ අනියම් පාවිච්චි කරුවන්ට කුලියට දෙනු ලැබේ.

(ඈ) යට කී (ඇ) ඡේදයෙහි දක්වූ කොන්දේසි සිරිත් පරිදි එකී උපකරණ කුලියට ගන්නවුන්ට අදළ නොවිය යුතුය. කොළඹ වරාය කොමිෂන් සභාව තමන්ගේ ගිණුමට ඇති තැන්පත් මුදල අනුව ඒවා ඔවුන්ට කුලියට ගැනීමට ඉඩ දිය යුතුය.

### (15) කිමිදුම් ගාස්තු

වරාය කොමිෂන් සභාවට අයත් කිමිදුම් කරුවන්ගේ සේවය ලබා ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු—

| | වරායයන් ඇතුළත | | වරායයන් පිටකදී | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| වැඩ කරන වේලාවන් තුළ දී එක් මුරයකට හෝ ඉන් කොටසකට | 375 | 0 | 555 | 0 |
| වැඩ කරන වේලාවලින් බැහැර හා සෙනසුරාදා, ඉරිදා හා නිවාඩු දිනවල දී | 750 | 0 | 1,110 | 0 |

වරායෙන් පිටත සේවයෙහි යෙදවුණු අවස්ථාවක දී කිමිදුම්කරුවා ඇත්ත වශයෙන් කිමිදුමෙහි නොයෙදුණු කාලය සම්බන්ධයෙන් ඉහත සඳහන් ගාස්තුවෙන් සියයට පණහක් පමණක් අය කරනු ලැබිය යුතු ය.

නාවික සේවාවක් වශයෙන් නොවන වෙනත් ආකාරයකට කිමිදුම්කරුවන්ගේ සේවය ලබා ගන්නා විට, වරායෙන් පිටත සේවයෙහි යෙදවුණු විට අදළ වන ගාස්තුව 50% අධි ගාස්තුවක් ද සමග අය කරනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—ගාස්තු අය කිරීමේ කාර්‍ය්‍ය සඳහා එක් මුරයක් පැය 4ක කාලයකට සමාන විය යුතුය.

### (16) සාමාන්‍ය කරුණු

**වරාය ගිනි නිවන හමුදාවේ සේවය සඳහා අය කෙරෙන ගාස්තු පහත දක්වෙන අයුරින් විය යුතුය :—**

| | රු. | ශ. |
|---|---|---|
| **(i) වෙරළේ හට ගන්නා ගිනි** | | |
| ගිනි නිවන හමුදාව යෙදවීම සඳහා | 260 | 0 |
| පාවිච්චි කරන එක් එක් මෝටර් පොම්පය සඳහා— | | |
| පළමු පැයට හෝ ඉන් කොටසකට | 130 | 0 |
| හැම අමතර පැයකට හෝ ඉන් කොටසකට | 105 | 0 |
| එක් එක් හයිඩ්‍රන්ට් ජල නළයකට— | | |
| අධිකාරීට—පැයකට හෝ ඉන් කොටසකට | 25 | 0 |
| ස්ථාන භාර නිලධාරියාට—පැයකට හෝ ඉන් කොටසකට | 16 | 0 |
| අංශ භාර නිලධාරියාට—පැයකට හෝ ඉන් කොටසකට | 10 | 0 |
| අනිකුත් නිලධාරීන්ට—එක් එක් අයෙකුට පැයකට හෝ ඉන් කොටසකට | 6 | 0 |
| මුර සේවය— | | |
| ‘අනිකුත් නිලධාරීන්’—එක් එක් අයෙකුට පැයකට හෝ ඉන් කොටසකට | 4 | 0 |
| **(ii) (නැව් ශෝධක තටාකය ඇතුළු) යාත්‍රාවල හට ගන්නා ගිනි** | | |
| ගිනි නිවන හමුදාව යෙදවීමට | 260 | 0 |
| පාවිච්චි කරන එක් එක් මෝටර් පොම්පය සම්බන්ධයෙන්— | | |
| පළමු පැයට හෝ ඉන් කොටසකට | 170 | 0 |
| හැම අමතර පැයකටම හෝ ඉන් කොටසකට | 130 | 0 |
| අධිකාරීට—හැම අමතර පැයකටම හෝ ඉන් කොටසකට | 25 | 0 |
| ස්ථාන භාර නිලධාරියාට —පැයකට හෝ ඉන් කොටසකට | 16 | 0 |
| අංශය භාර නිලධාරියාට—පැයකට හෝ ඉන් කොටසකට | 10 | 0 |
| ‘අනිකුත් නිලධාරීන්’—අයෙකුට පැයකට හෝ ඉන් කොටසකට | 6 | 0 |
| මුර සේවය— | | |
| ‘අනිකුත් නිලධාරීන්’—අයෙකුට පැයකට හෝ ඉන් කොටසකට | 4 | 0 |
| **(iii) බඩු ගොඩගැනීම** | | |
| ගිනි නිවන හමුදාව යෙදවීමට | 260 | 0 |
| පාවිච්චි කරනු ලබන එක් එක් මෝටර් පොම්පය සම්බන්ධයෙන්— | | |
| පළමු පැයට හෝ ඉන් කොටසකට | 130 | 0 |
| අමතර හැම පැයකටම හෝ ඉන් කොටසකට | 105 | 0 |
| මෝටර් ඇමුණුම් රථය හා පිරිස යෙදවීම සම්බන්ධයෙන්— | | |
| පළමු පැයට හෝ ඉන් කොටසකට | 85 | 0 |
| අමතර හැම පැයකටම හෝ ඉන් කොටසකට | 55 | 0 |

සාර්ථක බඩු ගොඩබෑමක දී ඉහත (iii) වැන්නෙහි සඳහන් වන ගාස්තුවට වඩා 50%ක වැඩිපුර ගාස්තුවක් අය කරනු ලැබේ.

වෙනත් විවිධ වැඩ සඳහා ඉහත (iii) සඳහන් ගාස්තු 50% අධි ගාස්තුවක් ද සමග අය කරනු ලැබේ.

### (17) ගිලන් සේවා කටයුතු සඳහා පාවිච්චි කරන ලාන්ච

ආණ්ඩුවේ ලාන්ච් පාවිච්චි කිරීමේ දී අදළ ගාස්තු මේ සඳහා අය කෙරේ.

එසේ වුව ද නිරෝධායන සහ රෝග නිවාරණ ආඥා පනත යටතේ සාදන ලද නියෝග අනුව පුද්ගලයන් හෝ බඩු හා ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීම සම්බන්ධ යෙන් අය කිරීමක් කරනු නොලැබේ. යාත්‍රාවක් පැමිණීමට හෝ පිටත්ව යෑමට අදළව යම් පණිවිඩයක් දනුම්දීම සඳහා අය කෙරෙන ගාස්තු පහත සඳහන් ආකාරයෙන් විය යුතුය :—

(අ) යම්කිසි වෙළඳ සමාගමක් හෝ පුද්ගලයකු වෙත නිතිපතා පණිවිඩ යැවීමේ සේවය සඳහා රු. 7.50කි.

(ආ) කොළඹ කොටුව ඇතුළත යම්කිසි සමාගමක් හෝ පුද්ගලයකු වෙත එක් පණිවිඩ සේවය සඳහා පණිවිඩයකට රු. 1 බැගින්.

(ඇ) කොළඹ කොටුවෙන් බැහැර වුව ද නාගරික සීමාව ඇතුළත වන්නා වූ සමාගමක් හෝ පුද්ගලයෙකු වෙත කෙරෙන එක් පණිවිඩ සේවය සඳහා එක් එක් පණිවිඩයකට රු. 2.50 බැගින් අය කරනු ලැබේ.

### (18) දුම් ගැස්සීම

දුම් ගැස්සීම සඳහා වන ගාස්තු පහත සඳහන් ආකාරයෙන් විය යුතුය :—

කොකෝවා

(1) සාමාන්‍ය සතිපතා දුම් ගැස්සීම—

(අ) රා. 140 නොවැඩි කොකෝවා අඩංගු මල්ලකට රු. 1.10

(ආ) ඊට අමතර රා. 28 කට හෝ ඉන් කොටසකට ශත 15ක ගාස්තුවක්.

(2) හදිසි දුම් ගැස්සීම—

නැව් බඩු පටවන්නකුගේ ඉල්ලීම පිට සතිපතා සාමාන්‍ය දුම් ගස්සන දිනෙන් පිටත කෙරෙන හදිසි දුම් ගැස්සීම සඳහා දුම් ගස්සන කුටියේ අල්ලන ප්‍රමාණයෙන් 75%ක අඩුම ගාස්තුවක් හෝ එකී කුටිය සඳහා නියමිත ගාස්තු වෙන් 75%ක් හෝ යන දෙකෙන් වැඩි ගාස්තුව අය කරනු ලැබේ.

| කුටි අංකය | | | විවිධ ද්‍රව්‍ය—රා. 140ක් හෝ ඊට අඩු මලුවලින් ගැනෙන පරිදි සාමාන්‍ය අල්ලන ප්‍රමාණය | | ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| 1 | ... | ... | 384 | ... | 325 | 0 |
| 2 | ... | ... | 1,008 | ... | 850 | 0 |
| 3 | ... | ... | 1,008 | ... | 850 | 0 |
| 4ඒ | ... | ... | 40 | ... | 35 | 0 |
| 4බී | ... | ... | 80 | ... | 65 | 0 |
| 4සී | ... | ... | 2 | ... | 2 | 0 |

බඩු තොගයකට අයත් නොවන්නාවූ ද, ඝන අඩි 10 කට වඩා නොවැඩි වන්නා වූ ද සාමාන්‍ය ඇහුරුම සඳහා රු. 2 බැගින් අය කරනු ලැබේ. එසේ වුව ද තනි ඇහුරුම් බාරගනු ලබන්නේ—

(අ) අවශ්‍ය ඉඩකඩ තිබුණොත් ; හා

(ආ) එකී ද්‍රව්‍ය වෙනත් ද්‍රව්‍ය සමග සුදුසු පරිදි දුම්ගැස්සීමට හැකිවෙතොත් ;

පමණකි.

අනුමත බලයක් අනුව කරනු ලබන නිවේදනයක් යටතේ ගෙවිය යුතු අමතර ගාස්තු ඉහත සඳහන් ගාස්තු ප්‍රමාණවලට ඇතුළත් නොවේ.

### (19) මිරිදිය

1. නැව් ශෝධක තටාකය, නියමු පාලම හා තෙල් තටාකය යන ස්ථානයන්හි දී යාත්‍රාවලට මිරිදිය සැපයීම සම්බන්ධයෙන් ගැලුම් 1,000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 14 බැගින් වූ ගාස්තු අය කරනු ලැබේ.

2. සාමාන්‍ය තෙල් පහසුකම් සැපයෙන නළ මාර්ග පිරිසිදු කිරීමට මිරිදිය සැපයීම සඳහා ගැලුම් 1,000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 1.50 බැගින් වූ ගාස්තුවක් අය කරනු ලැබේ.

### (20) ප්‍රිස්ට්මන් ග්‍රාබය

ටොන් එකේ සිට පහ දක්වා ඇති ප්‍රිස්ට්මන් ග්‍රාබය සඳහා දිනකට හෝ ඉන් කොටසකට රුපියල් සියය බැගින් වූ කුලියක් වරාය කොමසාරිස් විසින් අය කරනු ලැබේ.

සංලක්ෂ්‍යය:—(අ) වැඩපලේ සිට පැඩපළට යන්ත්‍රය ප්‍රවාහණය කිරීම කුලියට ගන්නා විසින් තම වියදමින් යොදගත යුතුය.

(ආ) සවි කිරීම හා ඉවත් කිරීමේ වියදම කුලියට ගන්නා විසින් දරිය යුතුය.

### (21) පාලම් කරාදිය

කොළඹ වරාය තුළ දී කොච්චිකඩේ පිහිටි පාලම් තරාදිය පාවිච්චි කිරීම සඳහා වරාය කොමසාරිස් විසින් එක් එක් දුම්රිය වැගන් රථයකට රුපියල් තුනයි ශත පණහ බැගින් වූ ගාස්තුවක් අය කරනු ලැබියයුතුය.

### (22) ලොරි කුලියට ගැනීම

කොළඹ වරාය කොමිෂන් සභාවේ ලොරි කුලී පහත සඳහන් පරිදි විය යුතුය :—

(i) ටොන් 3ට අඩු ලොරි සඳහා ගාස්තුව පැයකට හෝ ඉන් කොටසකට රු. 15 වන අතර සැතපුමකට හෝ ඉන් කොටසකට රු. 5 වේ.

(ii) ටොන් 3 සිට ටොන් 5 දක්වා ලොරි සඳහා ගාස්තුව පැයකට හෝ ඉන් කොටසකට රු. 20 වන අතර සැතපුමකට හෝ ඉන් කොටසකට රු. 6 වේ.

(iii) ටොන් 5 සිට ටොන් 8 දක්වා ලොරි සඳහා ගාස්තුව පැයකට හෝ ඉන් කොටසකට රු. 25 වන අතර සැතපුමකට හෝ ඉන් කොටසකට රු. 7 වේ.

වරාය කොමසාරිස් විසින් ටොන් 8ට වැඩි ලොරි සඳහා විශේෂ ගාස්තු නියම කරනු ඇත.

පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගාස්තු ඉහත සඳහන් ගාස්තු මෙන් 1¼ක් වනු ඇත.

(23) වෙනත් ජල යාත්‍රාදිය කුලියට දීම

(පැය 9ක දිනකට හෝ ඉන් කොටසකට)

(මේ යන්ත්‍ර සාමාන්‍යයෙන් කුලියට දෙනු නොලැබේ. ඒවා වරාය ඉංජිනේරු තැනට වුවමනා නොවූ විටක විශේෂ අවස්ථාවලට පමණක් කුලියට දීම සඳහා බලනු ලැබේ).

වෙනත් ජල යාත්‍රාදිය කුලියට දීම සම්බන්ධයෙන් පහත සඳහන් ගාස්තු අය කළ යුතුය :—

| යන්ත්‍රයේ නම | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ටොන් 10 සැරුම් යන්ත්‍රය | ... | ... | ... | 1,750 | 0 |
| ටොන් 5 සැරුම් යන්ත්‍රය | ... | ... | ... | 1,100 | 0 |
| වයිටන් බත්තල | ... | ... | ... | 1,250 | 0 |
| හොපර් බත්තල | ... | ... | ... | 200 | 0 |
| පන්ට් බෝට්ටුව | ... | ... | ... | 200 | 0 |
| නැංගුරම් බෝට්ටුව | ... | ... | ... | 300 | 0 |

**සංලක්ෂ්‍යය.**—(i) කුලියට ගත් කාලය සාමාන්‍ය වැඩ කරන වේලාවල් ඉක්ම යතොත් ඒ කාලය තුළ ද සෙනසුරාද, ඉරිද සහ ප්‍රසිද්ධ නිවාඩු දින තුළද මේ සැම යන්ත්‍රයක්ම වෙනුවෙන් 100 % ක අතිකාල ගාස්තුවක් අය කරනු ලැබේ.

(ii) වැඩ කරන සාමාන්‍ය දිනවල වැඩ කරන වේලාවල් වශයෙන් පෙ.ව. 7 සිට දහවල් 12 දක්වාත් ප.ව. 12.30 සිට ප.ව. 4.30 දක්වාත් කාලය සලකනු ලැබිය යුතුය.

(iii) එකී යාත්‍රා අවශ්‍ය තැන්වලට ඇදගෙන යාමට ලාන්චියක් පාවිච්චි කරනු ලැබුවහොත් කොළඹ වරාය කොමිසම සතු ලාන්ච් හා අලියා බෝට්ටු පාවිච්චිය සඳහා නියමිත ගාස්තු ප්‍රමාණය අනුව අමතර ලාන්ච් ගාස්තුවක් අය කරනු ලැබේ. යාත්‍රාව නැංගුරමින් හෝ වැඩපලින් පිටත්වූ වේලාවේ සිට එය ආපසු එම ස්ථානයට පැමිණි වේලාව අතර කාලය මේ සඳහා ගණන් ගනු ලැබේ.

(24) වායු පීඩක

වායු පීඩකයක් පාවිච්චි කිරීම සඳහා සාමාන්‍ය වැඩ කරන වේලාවල් තුළ පැයකට හෝ ඉන් කොටසකට රු. 60 බැගින් ද සාමාන්‍ය වැඩ කරන වේලා වලින් බැහැර සෙනසුරාද, ඉරිද හා ආණ්ඩුවේ නිවාඩු දිනවල එම ගාස්තුව 100 % කින් වැඩි කොට ද අය කරනු ලැබේ.

(25) නැව් ශෝධක තටාකයේ තිබෙන තැනින් තැනට ගෙන යා හැකි ටැලිපෝනය සහ පාර්ශ්ව නැංගුරම්වල තිබෙන කීලක ටැලිපෝන

1. නැව් ශෝධක තටාකයේ තිබෙන තැනින් තැන ගෙන යා හැකි ටැලිපෝනය හෝ පාර්ශ්ව නැංගුරම්වල තිබෙන කීලක ටැලිපෝනයක් වෙනුවෙන් දිනකට හෝ ඉන් කොටසකට රු. 7 බැගින් අය කරනු ලැබේ.

2. ඊට අමතර වශයෙන්, බාහිර ඇමතුම් සඳහා විදුලි සංදේශ ගමනා ගමන ආඥාපනතේ ඇති නියෝගවල සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—(අ) තැනින් තැනට ගෙන යා හැකි ටැලිපෝනය හෝ කීලක ටැලිපෝනය යාත්‍රාවක නියෝජිතයෙකුගේ ඉල්ලීම පිට පමණක් කුලියට දෙනු ලැබේ.

(ආ) (1) වන සහ (2) වන ඡෙදවල සඳහන් ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් කුලියට ගන්නා වගකිව යුතුය.

(ඇ) එකී උපකරණ ආපසු බාර දෙන තෙක් කුලියට ගන්නා අයගේ සන්තකයෙහි ඒ උපකරණ තිබෙන කාලය තුළ ඒවාට විය හැකි අලාභයක් සම්බන්ධයෙන් ඔහු වග කිව යුතුය.

(ඈ) කොළඹ වරාය කොමිෂමේ ගණකාධිකාරී වෙත සෑහෙන ඇපයක් තැන්පත් කෙරෙන තෙක් මේ උපකරණ කුලියට දෙනු නොලැබේ.

(26) රජයේ ලාන්ච් සහ කුඩා අලියා බෝට්ටු පාවිච්චි කිරීම සඳහා ගාස්තු

**වරාය තුළ :**

පළමුවන පැය හෝ ඉන් කොටසක් සඳහා රු. 100 බැගින් හා ඉන් අනතුරුව සෑම පැය ¼ හෝ ඉන් කොටසක් සඳහා රු. 25 බැගින්.

**වරායෙන් පිටත එහෙත් වරාය සීමාවන් තුළ :**

පළමුවන පැය හෝ ඉන් කොටසක් සඳහා රු. 200 බැගින් හා ඉන් අනතුරුව සෑම පැය ¼ හෝ ඉන් කොටසක් සඳහා රු. 50 බැගින්.

ආණ්ඩුවේ ලාන්ච් පාවිච්චි කිරීම සඳහා වූ කොන්දේසි

(අ) යම් විශේෂ කාර්යයක් සඳහා හෝ යම් විශේෂ අවස්ථාවලදී වරාය කොමසාරිස් විසින් ගාස්තු නියම කරනු ලැබිය යුතුය.

(ආ) අනතුරුදායක කාර්යයක් සඳහා ලාන්චියක් අවශ්‍ය වෙතොත් ඒ සම්බන්ධයෙන් රක්ෂණ කටයුතු යොදා ලිය යුතුය.

(ඇ) ඉහත සඳහන් ගාස්තු ගණන් බැලීමේ කාර්යය සඳහා ලාන්චියක් යෙදූන කාලය ලාන්චිය වරායේ සාමාන්‍ය කටයුතුවල නොයෙදුණු වේලාවේ සිට එකී කටයුතු සඳහා එය ආපසු ලැබුණු වේලාව තෙක් කාලය සැලකිය යුතුය.

(27) බංකරවලට පමණක් පැමිණෙන නැව් සඳහා විශේෂ අනුග්‍රහ

නියමු ගාස්තු, ටග් හා පිවිසුම් ගාස්තු ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු සඳහා 40%ක අඩුකිරීමකට ඉඩ දෙනු ඇත.

කලින් පැවති නියෝග පරිච්ඡින්න කිරීම

1974 මාර්තු 29 දින අංක 104/10 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ හා පසුව සංශෝධනය කරනු ලැබූ 1974 කොළඹ වරාය (වරාය ගාස්තු) පිළිබඳ නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

---

එල්.ඩී.-බී. 152/34.

නැව්තොට සංවිධායක ආඥාපනත

නැව්තොට සංවිධායක ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා විසින් කොළඹ වරාය වෙනුවෙන් සාද පිහිටුවනු ලැබූ රීතිය.

පී. බී. ජී. කලුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍ය වරයා.

1975 ජනවාරි මස 28 වැනි දින,
කොළඹදීය.

රීතිය

1936 ඔක්තෝබර් මස 16 වන දින අංක 8,251 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබ 1970 ඔක්තෝබර් මස 31 වන දින අංක 14,930/2 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රීතිය මගින් අවසන් වරට සංශෝධිත 1936 කොළඹ වරාය රීතිවල 21 වන රීතියෙහි (1) වන ඡෙදය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් එම රීති තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ' ශත දෙළහ ' යන වචන වෙනුවට ' ශත පහළොහ ' යන වචන ආදේශ කිරීමෙන් ; සහ
(2) ' රු. 120 ' යන යෙදුම වෙනුවට ' රු. 200 ' යන යෙදුම ආදේශ කිරීමෙන්.

---

නැව්තොට සංවිධායක ආඥාපනත

නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා විසින් (369 වන අධිකාරය වූ) නැව්තොට සංවිධායක ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ ත්‍රිකුණාමලය වරාය වෙනුවෙන් සාද පිහිටුවනු ලැබූ රීතිය.

පී. බී. ජී. කලුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා.

1975 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දීය.

රීතිය

නැව්තොට සංවිධායක ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ ත්‍රිකුණාමලය වරාය වෙනුවෙන් සාද පිහිටුවනු ලැබ, 1971 මාර්තු මස 5 වන දින අංක 14,948 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රීතිවල 1 වන රීතිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ' නියමූ ගාස්තු ' යන ශීර්ෂය යටතේ, එහි (1) වන ඡේදයෙහි—

(අ) ' ශත දෙළහ ' යන වචන වෙනුවට ' ශත පහළොහ ' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ' රු. 120 ' යන යෙදුම වෙනුවට ' රු. 200 ' යන යෙදුම ආදේශ කිරීමෙන්.

(2) ' අලියා බෝට්ටු ගාස්තු ' යන ශීර්ෂය යටතේ—

(අ) එම ශීර්ෂ පාඨය යටතේ ' 400.00 ' යන ඉලක්කම් යෙදෙන සෑම තන්හිම ඒ වෙනුවට ' 600.00 ' යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ' 800.00 ' යන ඉලක්කම් වෙනුවට ' 1,200.00 ' යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ' 1,200.00 ' ඉලක්කම් වෙනුවට ' 1,800.00 ' යන ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(3) ' රජයේ ලාන්ච් යාත්‍රා පාවිච්චි කිරීම සඳහා ගාස්තු ' යන ශීර්ෂය යටතේ දක්වෙන සියලුම විෂයයන් වෙනුවට පහත සඳහන් අලුත් විෂයයන් ආදේශ කිරීමෙන් :—

" වරාය තුළ—

පළමු පැය හෝ ඉන් කොටසක් සඳහා රු. 100 බැගින් හා ඉන්පසු සෑම පැය ½ හෝ ඉන් කොටසක් සඳහා රු. 25 බැගින් වන ගාස්තුවක් අය කරනු ලැබේ.

වරායෙන් පිටත, එහෙත් වරාය සීමාවන් තුළ—

පළමු පැයට හෝ ඉන් කොටසක් සඳහා රු. 200 හා ඉන් පසු සෑම පැය ½ හෝ ඉන් කොටසක් සඳහා රු. 50 බැගින් අය කරනු ලැබේ.

රජයේ ලාන්ච් යාත්‍රා පාවිච්චි කිරීම සඳහා කොන්දේසි

(අ) යම් විශේෂ කාර්යයක් සඳහා හෝ යම් විශේෂ අවස්ථාවලදී වරාය කොමසාරිස් විසින් ගාස්තු නියම කරනු ලැබිය යුතුය.

(ආ) අනතුරුදායක කාර්යයක් සඳහා ලාන්චියක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් රක්ෂණ කටයුතු යොදලිය යුතුය.

(ඇ) ඉහත සඳහන් ගාස්තු ගණන් බැලීමේ කාර්යය සඳහා, ලාන්චියක් වරායේ සාමාන්‍ය කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකිවීම අවසන්වන වේලාවේ සිට එකී කටයුතු සඳහා එය නැවත ප්‍රයෝජනයට ගත හැකි වන වේලාව තෙක් වූ කාලය එම ලාන්චිය වැඩෙහි යෙදී තිබෙන කාලය වශයෙන් සැළකිය යුතුය. "

---

එල්. ඩී.—බී 152/34.

නැව්තොට සංවිධායක ආඥාපනත

නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා විසින් (369 වැනි අධිකාරය වූ) නැව්තොට සංවිධායක ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ ගාලු වරාය වෙනුවෙන් සාද පිහිටවනු ලැබූ රීති.

පී. බී. ජී. කලුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1975 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දීය.

රීති

ගාලු වරාය වෙනුවෙන් නැව්තොට සංවිධායක ආඥාපනත යටතේ සාද පිහිටවනු ලැබ, 1971 ජූලි 23 වන දින අංක 14,967/10 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රීතිවල 1 වන රීතිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) (i) ' නියමූ ගාස්තු ' යන ශීර්ෂය යටතේ වූ එහි (1) වන ඡේදයේ—

(අ) ' ශත දෙළහ ' යන වචන වෙනුවට ' ශත පහළොහ ' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ' රු. 120 ' යන යෙදුම වෙනුවට ' රු. 200 ' යන යෙදුම ආදේශ කිරීමෙන්.

(2) (ii) ' අලියා බෝට්ටු ගාස්තු ' යන ශීර්ෂය යටතේ—

(අ) ඒ ශීර්ෂය යටතේ ' 400.00 ' යන සංඛ්‍යාව යෙදෙන කවර ස්ථානයක වුවද ඒ වෙනුවට ' 600.00 ' යන සංඛ්‍යාව ආදේශ කිරීමෙන් ;

(ආ) ' 800.00 ' යන සංඛ්‍යාව වෙනුවට ' 1,200.00 ' යන සංඛ්‍යාව ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ' 1,200.00 ' යන සංඛ්‍යාව වෙනුවෙට ' 1,800.00 ' යන සංඛ්‍යාව ආදේශ කිරීමෙන්.

(3) ' රජයේ ලාන්ච් යාත්‍රා පාවිච්චි කිරීම සඳහා ගාස්තු ' යන ශීර්ෂය යටතේ දක්වෙන සියලුම විෂයයන් වෙනුවට පහත සඳහන් අලුත් විෂයයන් ආදේශ කිරීමෙන් :—

" වරාය තුළ—

පළමුවන පැය හෝ ඉන් කොටසක් සඳහා රු. 100 බැගින් හා ඉන් පසු සෑම පැය ½ හෝ ඉන් කොටසක් සඳහා රු. 25 බැගින් වන ගාස්තුවක් අය කරනු ලැබේ.

වරායෙන් පිටත, එහෙත් වරාය සීමාවන් තුළ—

පළමුවන පැය හෝ ඉන් කොටසක් සඳහා රු. 200 බැගින් හා ඉන් පසු සෑම පැය ½ හෝ ඉන් කොටසක් සඳහා රු. 50 බැගින් අය කරනු ලැබේ.

රජයේ ලාන්ච් යාත්‍රා පාවිච්චි කිරීම සඳහා කොන්දේසි

(අ) යම් විශේෂ කාර්යයක් සඳහා හෝ යම් විශේෂ අවස්ථාවලදී වරාය කොමසාරිස් විසින් ගාස්තු නියම කරනු ලැබිය යුතුය.

(ආ) අනතුරුදායක කාර්යයක් සඳහා ලාන්චියක් අවශ්‍ය වෙතොත් ඒ සම්බන්ධයෙන් රක්ෂණ කටයුතු ද යොදු ලිය යුතුය.

(ඇ) ඉහත සඳහන් ගාස්තු ගණන් බැලීමේ කාර්යය සඳහා, ලාන්චියක් වරායේ සාමාන්‍ය කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකිවීම අවසන් වන වේලාවේ සිට එකී කටයුතු සඳහා එය නැවත ප්‍රයෝජනයට ගත හැකි වන වේලාව තෙක් වූ කාලය එම ලාන්චිය වැඩෙහි යෙදී තිබෙන කාලය වශයෙන් සැළකිය යුතුය. "

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.